මා කලක් සේවය කළ ස්ථානයක පැවති එක් සම්ප්‍රදායක් වූයේ, අපේ පිරිසට අලුතෙන් යමෙකු එකතු වූ විට සහ නැතිනම් අප සමග සිටි අයෙකු එතැනින් ඉවත්ව යන විට, දිවා ආහාරය සඳහා අසල පිහිටි ආපන ශාලාවකට ගොස් එකට කා, බී, එම අවස්ථාව සැමරීමයි.

කාර්යාලය පිහිටි ප්‍රදේශයේ මේ ආකාරයේ අවශ්‍යතා සැපිරීමට සැදි පැහැදී සිටි, ටොම්-යෑම් තැම්බුම් හොද්දේ සිට නාසි-ගෝරිමය දක්වා ද, බීෆ් බර්ගරයේ සිට මාගරිටා පීසාව දක්වා ද, විවිධාකාර ජාත්‍යන්තර ආහාර වර්ග විකිණීමට ඇති ආපන ශාලා විශාල සංඛ්‍යාවක් විය.

මේ ආකාරයේ දිවා භෝජනයන් හි දී වයින් පානය කිරීම ද ඒ සම්ප්‍රදායේ ම කොටසක් ලෙස සිදුවුණි. අප සාමාන්‍යයෙන් යනෙන ආපන ශාලා ද අපටම ගැලපෙන "බීවයිම්" හෙවත් "ඔබේ බීම ඔබ ම ගෙනෙන්න" වර්ගයේ ඒවා විය.

එක් දිනක් මේ ආකාරයට දිවා භෝජනය සඳහා අප ගියේ අලුතෙන් සේවයට බැඳුණු කාන්තාවක් වූ ෆ්‍රාන්සස් පිළිගැනීමටයි. කලින් ෆෙඩරල් රජයේ රැකියාවක් කර, අස්වී, ඉන් කලකට පසුව මා සේවය කරන ප්‍රාන්ත රජයේ ආයතනයේ රැකියාව ඇරඹූ ඇය එකල වයස පහස් පහක පමණ අයෙකු වූවා ය.

බින්දු, බින්දු ද හතරේ න්‍යාය

එදා අප සමග හත් අට දෙනෙකු සිටි නිසා අප ආපනශාලාව කරා ගොස් සිටියේ, මඳ පමණින් පානය සඳහා, වයින් බෝතල් දෙක තුනක් ද සමගිනි.

ඇණවුම් කළ ආහාර වර්ග සකසා ගෙන එනතුරු අපි මුල් වයින් බෝතලය විවෘත කළෙමු. එහි සිටි පිරිසේ සංඛ්‍යාවට අනුව, මුල් වයින් බෝතලය වීදුරු සියල්ල කට කපා පුරවන්නට නො සෑහුනි. ඒ බෝතලයෙන් වයින් අවසානයට තම වීදුරුවට වත්කර ගත් තැනැත්තා, හිස් බෝතලය පසෙක තබා, දෙවෙනි වයින් බෝතලය විවෘත කළේය.

අලුතෙන් පැමිණි ෆ්‍රාන්සස්ට සුබ පැතූ අපි වයින් තොල ගෑම ඇරඹුවෙමු.

"මට අර හිස් බෝතලය දෙන්න!" ෆ්‍රාන්සස් ඉල්ලා සිටියා ය.

බෝතලය අතට ගත් ඇය, එය තම වයින් වීදුරුවට ඇල කරමින් අපෙන් ප්‍රශ්න කළේ "ඔයාලා දන්නවාද, ඕනෑම හිස් කරපු වයින් බෝතලයක තව අඩු වශයෙන් බින්දු දහතරක් තියෙන බව?" කියාය.

අප කිසිවෙකු එය එක්වරම විශ්වාස නො කළෙමු. නමුත් ෆ්‍රාන්සස් ඇය නිවැරදි බව අපට අපේ ඇස් ඉදිරිපිට දී ම පෙන්වා දුන්නා ය.

ඇත්ත වශයෙන්ම ඒ හිස් බෝතලයේ ඇය පැවසූ අවමය වූ බින්දු දහතර වෙනුවට බින්දු විසි හතරක් ම තිබුණි.

"හොඳයි අපි බලමු කෝ දෙවෙනි බෝතලයටත් ඔයා ගේ ඔය න්‍යාය හරිද කියලා?" අපේ සගයෙක් පැවසීය.

"අමුතුවෙන් බලන්න දෙයක් නෑ, ඒකත් එහෙමම තමයි. හොඳයි, මේ පාර හොඳට පරිස්සමින් අන්තිම ටිකත් වීදුරුවට වත්කරගත්තාට පස්සේ මට හිස් බෝතලය දෙන්න!" ෆ්‍රාන්සස් කීවාය. අපේ දෙවෙනි බෝතලය වහා හිස් කළෙමු.

අවසානයට තම වීදුරුව පුරවා ගත් තැනැත්තා ඔහුට හැකි පමණින් අවසාන වයින් බින්දුව ද බේරා ගෙන හිස් බෝතලය ෆ්‍රාන්සස් අතට දුන්නේ ය.

මෙවර විනාඩි දෙක තුනක් වැය කරමින් එක දිගටම ඉතා සීරුවෙන් හිස් වයින් බෝතලය තම වීදුරුවට ඉහළින් ඇල කර අල්ලාගෙන සිටි ෆ්‍රාන්සස් යළිත් තම න්‍යාය නිවැරදි බව අපේ පිරිසට පෙන්වා දුන්නා ය.

එවර හරියටම වයින් බින්දු ද හතරක් හිස් බෝතලයෙන් උකහා ගැනීමට ඇය සමත් වූවා ය. තුන්වෙනි නොහොත් අවසාන බෝතලයෙන් ඒ දස්කම කළේ අප පිරිසේ සිටි වෙනකෙකි.

ගණිත අභ්‍යුහන න්‍යායේ තාක්ෂණික පිළිවෙත කෙසේ වුවද, මේ සජීවී උදහරණ තුළින්, ෆ්‍රාන්සස් ගේ "බින්දු බින්දු දහතරේ න්‍යාය" නිවැරදි එකක් බව අපි සියලු දෙනාම එදා පිළිගත්තෙමු. එපමණක් නොව, එදා සිට අද දක්වා ම, තනිවම කෙරෙන අනුමතවීමක දී හෝ මිතුරු සමාගමක දී හෝ වයින් බෝතලයක් හිස් වෙන හැම අවස්ථාවකදී ම මට ෆ්‍රාන්සස් ගේ "බින්දු බින්දු ද හතරේ න්‍යාය" සිහිවේ. හැකි සෑම විටකදී ම ඒ න්‍යාය නැවත නැවත ඔප්පු කර පෙන්වීමට ද මම නොපැකිළෙමි.

මගෙන් මේ "බින්දු බින්දු ද හතරේ න්‍යාය" දැනගත් අයගෙන් සමහරු ද ඒ ලෙසම කරනවා ඇති යැයි සිතමි.

වයින් සඳහා පමණක් නොව විස්කි වැනි පානයන් සඳහා ද මේ න්‍යාය නිවැරදි බව මා අත්දැකීමෙන් ම පසක් කොට ගෙන ඇත්තෙමි.

බීයර් සඳහා එහි නිවරදියතාව ගැන මා හරියට නොදන්නේ බොහෝ විට අප බීයර් කුප්පි කටට ම තබා පානය කරන නිසා ය. බීයර් යනු මා ප්‍රිය කරන පානයක් නොවන නිසා, අමතර බින්දු කිහිපයක් වැඩි ප්‍රයෝජනයක් ද මට නැත!

ෆ්‍රාන්සස් ගේ "බින්දු බින්දු ද හතරේ න්‍යාය" ප්‍රායෝගිකව පරීක්ෂණයට බඳුන් කිරීම ප්‍රීතිජනක කාරණයක් වුවත්, ඒ සමගම ෆ්‍රාන්සස්ව සිහිවීම නම් දුකට කරුණකි.

අත්‍යවශ්‍ය ශල්‍යකර්මයක් සඳහා සේවයේ නිවාඩු ලබා ගත් ෆ්‍රාන්සස් ඉන් පසු කිසි දිනෙක යළි සේ-වයට නො ආවාය. ඒ ශල්‍යකර්මය සාර්ථක නො-වුණු බවත්, ටික කලකට පසු ඇය මෙලොව හැර ගිය බවත් මට පසුව අසන්නට ලැබුණි.

අද ෆ්‍රාන්සස් අප අතර නොමැති වුණ ද, ඇය එදා මට හඳුන්වා දුන්, මා අද ඔබට හඳුන්වා දෙන, ඒ " බින්දු බින්දු ද හතරේ න්‍යාය" නම් සැමඳ පවතිනු ඇත!

කරුණාකර ඔබ සහභාගීවෙන ඊළඟ සාදයේ දී ෆ්‍රාන්සස් ගේ "බින්දු බින්දු ද හතරේ න්‍යාය" අත්හදා බලන්න!

ෆ්‍රාන්සස්ව ද සිහි කරන්න!

ශ්‍රී ලාංකීය ඔබහට
නිවසේදීම සැකසූ ප්‍රණීත ආහාර
ඉතා පහසු මිලකට
පිළියෙල කර දෙනු ලැබේ

ඇනවුම් සඳහා අමතන්න
0416 966 621

αlpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing

Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093